# නුවණක්කාරයෝ



රශිනි විමර්ශා රත්නායක

# නුවණක්කාරයෝ

රශිනි විමර්ශා රත්නායක

කතෘ ප්‍රකාශනයකි.

2023.11.15

ISBN 978-624-206-784-1

# පිදුම

ආදරයෙන්

මාව බලාගන්න

අම්මා,

අප්පච්චි,

අත්තා

සහ

අත්තම්මාට

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහු විධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන් ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි. මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

ශෂිකලා සේනාධීර (විදුහල්පතිනිය)

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

දවසක් යාළුවෝ දෙන්නෙක් කැලෑවක් මැදින් ගමනක් ගියා.



ඔහොම යනකොට හොඳටම රෑ වුණා.



එයාලට බඩගින්නක් ආවා.

ඒක හින්දා කෑමක් හොයාගන්න දිගටම ඇවිදගෙන ගියා. ඒ දෙන්නා දැක්කා මී අඹ ගහක්.

ඒ ගහේ ලොකු ගෙඩි ටිකක් තිබුණා.



බඩගින්න
වැඩිකමටම ළගපාත
තිබ්බ ලී ,ගල්,පොලූ
අරගෙන අඹ ගෙඩි
කඩාගන්න සිතුවා.

ඒත් ඒවා එකක්වත්
වැටුණේ නෑ.



එක පාරටම සර සර
ගාලා ඒ ගෙඩි
පියැඹුවා.



එයාලා බයවෙලා
දිවුවා.

මගට ගිහින් හැරිලා
බලද්දි තමයි දැක්කේ
ඒ බාගෙට නිදාගෙන
හිටපු වවුල්ලු ටිකක්
කියලා. දෙන්නට හරි
හිනා. දෙන්නම
රැවටිලා තියෙන්නේ
තඩි වවුල්ලුන්ට.



ආයෙත් පාරක් අඹ ගස ළඟට ගියාම දැක්කා එකම එක අඹ ගෙඩියක් වැටිලා තියනවා.



ඒක අහුලගන්න
හදන කොටම
මෙන්න ආපහු
පාරක් සර සර සද්දේ
ඇහුණා.

දෙන්නටම එක පාරටම උඩ බැලුණා.එතකොට තමයි දැක්කේ වඳුරෝ රංචුවක් ගහ උඩ ඉන්නවා.



“අද නම් අපිට අඹ කන්න වෙන්නේ නෑ“ සංජය කිව්වා. ටිකක් කල්පනා කරපු මිනුල් කිව්වා “අපි අර තොප්පි වෙළෙන්දා වගේ කරමු” කියලා.

අහුලගත්ත අඹ ගෙඩිය උඩට වීසි කලා.



එදාට හඳ එළියත්
තිබ්බ හින්දා වඳුරො
ටික මේක දැකලා
ගහේ තිබ්බ අඹ
ගෙඩි ටිකක් බිමට
විසිකරා.



යාළුවෝ දෙන්නා අඹ කාලා බඩ පුරවගෙන සතුටින් ගෙදර ගියා



# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු!

මෙයට,

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20

ISBN 978-624-206-784-1